# ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය

# තේ පර්යේෂණ මණ්ඩලය

## වැවිලි අමාත්‍යාංශය

# වතු වෛද්‍ය වෘත්තික තනතුර

# ශා. කූම්බ්ස් වත්ත, තලවාකැලේ.

ඉහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**රැකියා විස්තරය :**

වතු අධිකාරිවරයාගේ මග පෙන්වීම යටතේ, එදිනෙදා සේවක වෛද්‍ය අවශ්‍යතාවන්හි නිරත වෙමින් සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් පවත්වාගෙන යාම,

එසේම, අදාළ සියලු ලිපිලේඛන පවත්වාගෙන යමින්, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සමග සෞඛ්‍යසේවා සඳහා සම්බන්ධීකරණය කිරීමට හැකිවිය යුතුය.

සේවා සම්බන්ධීකරණය කිරීම.

**අධ්‍යාපන සුදුසුකම් :**

අ.පො.ස. (ස/පෙළ) විභාගය ඉංග්‍රීසි සහ ගණිතය අංක ගණිතය සහිතව සමත්ව සිටීම (වෘත්තියේ පළපුරුද්ද සහිත අයට මෙය අදාළ නොවේ.)

සහ

ලංකා වෛද්‍ය විද්‍යාල සභාවේ ලියාපදිංචි සාමාජිකත්වය,

**පළපුරුද්ද:**

කනිෂ්ඨ වතු වෛද්‍ය සහකාරවරයකු (JEMA) ලෙස වසර 4 ක පළපුරුද්ද.

**වැටුප් පරිමාණය**

රු. 32,320/- 1,350X40-රු. 86,320/-

වාර්ෂික වැටුප් වර්ධකය - රු. 1,350/-

**වයස් සීමාව :**

අවුරුදු 22 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය.

මෙම තනතුර ස්ථිරය, තෝරාගනු ලබන අයදුම්කරු සේවා අවශ්‍යතාව මත තලවාකැලේ ශාන්ත කූම්බ්ස් වත්තේ හෝ ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය මගින් කළමණාකරනය කරනු ලබන වෙනත් වත්තක සේවය කළ යුතුවේ.

සම්පූර්ණ ජීව දත්ත ඇතුළත් අයදුම්පත් උප්පැන්න සහතිකයේ පිටපතක්, අදාළ අධ්‍යාපනික හා වෙනත් වෘත්තීය සුදුසුකම්, සේවා සහතිකවල පිටපත් සහ අයදුම්කරුගේ නිපුණතා හා අදාළ ක්ෂේත්‍රයේ දැනුම පිළිබඳ විමසිය හැකි ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන්ද සමග **2021 අප්‍රේල් 12 දින හෝ ඊට පෙර** ලැබෙන සේ පහත අත්සන් කරන අය වෙත ලියාපදිංචි තැපැලෙන් ලැබෙන්නට සැලැස්විය යුතුය.

රාජ්‍ය සේවා/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. මෙම අවශ්‍යතාවය හා අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ. අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුවේ.

තොරතුරු සඳහා අපගේ වෙබ් අඩවිය වන www.tri.lk වෙත යොමුවන්න

**අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය,**
**ශාන්ත කූම්බ්ස්, තලවාකැලේ.**